**සීමාසහිත ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම - 2015**

---

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.මෙම විගණනය සිදු කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂමණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ("අධ්‍යක්ෂ මණ්ඩලය")වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂමණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) තොග අගය කිරීමේ වාර්තා නොමැතිවීම හේතුවෙන් රු.4,445,013 ක් වටිනා තොග අගය කිරීමේ නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි විය.

(ආ) වෙනත් ලැබිය යුතු වටිනාකමවූ රු.8,969,395ක ශේෂය සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛණ, වයස් විශ්ලේෂණ, ශේෂ තහවුරු , ඉන්වොයිසිපත් සහ වෙනත් මූලාශ්‍ර ලේඛණ නොමැති වීම හේතුවෙන් එම අගය තහවුරු කළ නොහැකි විය.

(ඇ)ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකම වූ රු.949,399ක ශේෂය සම්බන්ධයෙන් සේවක පත්වීම් ලිපි සහ අදාල පෞද්ගලික ලිපිගොණු වැනි තොරතුරු නොමැතිවීම හේතුවෙන් එම අගයෙහි නිරවද්‍යතාවය තහවුරු කළ නොහැකි විය.

(ඈ)වෙළඳ හා වෙනත් ගෙවිය යුතු වටිනාකම වූ රු.6,810,914 ක ශේෂය සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛණ, වයස් විශ්ලේෂණ, ශේෂ තහවුරු ,ඉන්වොයිසිපත් සහ වෙනත් මූලාශ්‍ර ලේඛණ නොමැති වීම හේතුවෙන් එම අගයේ නිවැරදිතාවය තහවුරු කළ නොහැකි විය.

(ඉ) සමාගමෙහි ස්ථාවර වත්කම් අංකනය කර නොමැති අතර ස්ථාවර වත්කම් ලේඛණයක් ද ඉදිරිපත් කර නොමැති බැවින් ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය මගින් තහවුරු කිරීමට නොහැකි බව විගණනයට නිරීක්ෂණය විය.

(ඊ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විගණනයට තහවුරු කර ඇති පරිදි, සමාගම බදු වගකීමක් ලෙස ජාතිය ගොඩනැංවීමේ බද්ධ ගෙවිය යුතුව පවතී,එසේ වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මෙම වගකීම සම්බන්ධව වෙන් කිරීමක් සමාගම සිදුකර නොතිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ,

තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ 1.4 දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනියන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත්ය.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව,සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය බදු පූර්ව ශුද්ධ පාඩුව රු.13,944,614ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු.9,635,596ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,580,210ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඉවත් කිරීමේ ලාභය රු.54,033,000 කින් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව සමාගම සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන වාර්තාව පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

භෞතික තොග ශේෂය එක් එක් මාසය අවසානයේදී ලෙජර ගිණුම් සමග සැසඳුම් කර නොතිබුණි.

## 4.2 ඌන උපයෝජිත වත්කම්

වරකට බිත්තර 57,200ක ධාරිතාවයක් යෙදවිය හැකි සෙටර් (setter) යන්ත්‍රයක් හා ආහාර ඇඹරුම් යන්ත්‍රයක් භාවිතයට නොගෙන නිශ්කාර්යව පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ)2006 සැප්තැම්බර් 22 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30/2006 ප්‍රකාරව සමාගම කාර්ය මණ්ඩලය හඳුනාගෙන නොමැති අතර සමාගම බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙළ කර නොතිබුණි.

(ආ)2016 ජුනි 16 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016ට අනුකූල නොවන පරිදි සමාගම කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 4.2.1 (අ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලස්මක් පිළියෙළ කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ප්‍රසම්පාදන කළමනාකරණය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | ගිණුම්කරණ පද්ධතියේ අභ්‍යන්තර පාලනය බිඳ වැටීම. |
| (ඇ) තොග කළමණාකරණය | නිකුතු නියෝග භාණ්ඩ නිකුත්කිරීමේදී තුණ්ඩු සමග සැසඳුම් නොකිරීම |